මේ වේදිකාවෙ ජීවිතේ අපේ

miyuru gii Project
Computer Center
University of Ruhuna
Matara – Sri Lanka

ගායනය: *අතුල අධිකාරී*
රචනය:
සංගීතය:

අපට සිංදුවක් ලියන්න
අපට සිංදුවක් ගයන්න
අපට සිංදුවක් අහන්න ආසයි

ඔබට සිංදුවක් ලියන්න
ඔබට සිංදුවක් ගයන්න
ඔබේ සතුට වී බලන්න ආසයි

මේ වේදිකාවෙ ජීවිතේ අපේ
සාගරේ වගේ විශාල වේ

අපිට සාමයෙන් සිටින්න
අපිට ප්‍රේමයෙන් බැඳෙන්න
අපිට ක්‍රෝදයෙන් මිදෙන්න ආසයි
ඔබට මේ පැතුම් කියන්න
ඔබට වාසනා ගෙනෙන්න
ඔබට මේ පැතුම් පතන්න ආසයි

මේ වේදිකාවෙ ජීවිතේ අපේ
සාගරේ වගේ විශාල වේ

රටට සාමයක් ගෙනෙන්න
දැයට ආදරෙන් බැඳෙන්න
දසත ජීවයක් ගෙනෙන්න ආසයි
හිතේ සතුට මල් පිපෙන්න
නෙතේ රස අඳුන් මැවෙන්න

ලොවට ආදරය කරන්න ආසයි

මේ වේදිකාවෙ ජීවිතේ අපේ
සාගරේ වගේ විශාල වේ